ඇමුණුම I

**RG/AB/10/01/උසස් කිරීම**

2026.07. 09

2016 වර්ෂයේ පත්වීම් ලද රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් වෙත,

**<u>රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම.</u>**

2016.06.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II ශ්‍රේණියට පත්වීමක් ලද නිලධාරීන් වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ I ශ්‍රේණියට උසස් කල හැකි වේ.

02. ඒ අනුව , පහත සුදුසුකම් සපුරන ලද නිලධාරීන් ඇමුණුම I මගින් දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පල කර ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඔබගේ ආයතන ප්‍රධානියා මගින් නිර්දේශ කර ලියාපදිංචි තැපෑලෙන් 2026.08.31 දිනට ප්‍රථම යොමු කරන ලෙසට කාරුණිකව දන්වමි.

01.පත්වීම ස්ථිර කර තිබීම.

02.උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ IIශ්‍රේණියේ අවම වශයෙන් වසර 10ක සක්‍රිය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 10උපයාගෙන තිබීම.

03. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වසර 10ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

04. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

05. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

06. අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

එච්.පී. චන්ද්‍රලාල්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

එච්.පී.චන්ද්‍රලාල්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට


දුරකථන : 0112-072038
ෆැක්ස් : 0112-889493
විද්‍යුත් ලිපිනය : sdrg@rgd.gov.lk